// ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 243/26—1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා—1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (70)/76.

### (40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත

අගමැතිගේ නිර්දේශය අනුව, මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වී. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

#### නියෝග

1. මේ නියෝග හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන අත්හිටුවීමේ) නියෝග නමින් හඳුන්වනු ලැබේ.

2. වෙනයම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මේ නියෝග යටතේ පත් කරනු ලැබූ නියම බලධරයා විසින් ආඥාවක් කරනු ලැබූ විට, යම්කිසි ලිඛිත නීතියක් යටතේ ස්ථාපිත යම් පළාත් පාලන ආයතනයක පරිපාලනය එම පළාත් පාලන ආයතනය පිහිටා ඇති ප්‍රදේශයේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා වෙත මෙම නියෝගය බලපවත්වනතාක් හා ඒතාක් පමණක් පැවරිය යුතුය ; තවද, එපරිද්දෙන් එම පළාත් පාලන ආයතනයක පරිපාලනය පැවරී ඇති එම සහකාර කොමසාරිස්වරයා විසින් ඉහත කී කාලසීමාව තුළ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ, එම පළාත් පාලන ආයතනයේ සහ එහි සභාපතිගේ හෝ නගරාධිපතිගේ සියලුම බලතල පාවිච්චි කිරීම හා යුතුකම් ඉටු කිරීම කළ යුතුය.

3. 2 වැනි නියෝගයේ " පළාත් පාලන ආයතනය " යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් කෙරේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

55A——ඊ 24317—2,100 (76/12)